සතුටුවීමයි. මේ සඳහා ලොකු කුඩා භේදයක් නැත. තරුණ මහලු පොඩි දරුවන් එක්වී සතුටු වෙති. ප්‍රීති වෙති. මේ ක්‍රීඩා අතර ඔන්චිල්ලා පැදීම, රබන් ගැසීම, ගුඩු ඇදීම, ඔලිඳ සෙල්ලම ආදී සෙල්ලම් රාශියක් තිබේ. අවුරුදු දවසේ ගෙවල් දොරවල්වල තිබෙන තවත් විශේෂයක් වන්නේ අසල් වාසී හිතවතුන්ට මෙන්ම ඥාතිවරුන් කැවිලි පෙවිලි ආදී අවුරුදු කෑම ගෙවල් වලට ගෙන යෑමයි. මේ නිසා ඔවුන්ගේ හිතවත් කම් තව තවත් වර්ධනය වේ.

මේ අයුරින් ඉතා සතුටින් සමරනු ලැබූ අවුරුද්ද අවසන් වී ටික දිනකින් හිස තෙල් හා රැකියා සඳහා පිටත් වී යති.
අපේ සංස්කෘතිය හා බැඳුනු සාරධර්ම මුල්කරගෙන පවත්වන අවුරුදු උත්සවය නිසා එකිනෙකා අතර සුහද බව වර්ධනය වේ. එදා ආදී කාලයේ සිට අද දක්වාම නොකඩවා මෙම චාරිත්‍ර වාරිත්‍ර කෙලි සෙල්ලම් පවත්වා ගෙන ඒම අනාගත පරපුරටද ඉතිරි කර තැබීම ඉතා වැදගත් කරුණකි. අපේ සෙන්ට් ඔල්බන්ස් සිංහල භාෂා පාසල මෙවරත් අප්‍රේල් මස 7 වෙනි දින පවත්වන අවුරුදු උත්සවය 12වන වතාවන්ටත් වඩා ඉතා ඉහල තත්වයකින් මෙන්ම වෙනස්කම් රාශියකින් යුක්තව පැවැත්වීම විශේෂයකි.

පාරමිතා බෞද්ධ පංසල, බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සමිතිය හා සිංහල භාෂා පාසල අවුරුදු උදානය බක්මහ උළෙල Sassella Park – 121 – Station Rd Deer Park (mel – 25.E.6) හි දී පවත්වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයනට අවුරුදු අසිරිය මුණවරදී විඳින්නට ඉඩ ලබා දෙමින් ය. ඔබ සියල්ලන්ගේ සහභාගීත්වය අපි අගේ කොට සලකමු.

33 වන පිටෙන්

මෙවන් අංකුර කවි කිවිඳියන් සිය නිර්මාණ මගින් දක්වන කුෂලතාව නොමඳය. එබදු, නිර්මාණවලින් කියා පාන සමාජ යථාර්ථය හා ඊට එක් කර ඇති අර්ථවත් පණිවුඩද එම නිර්මාණවල යම් තරමක හෝ සාර්ථකත්වයක් මතු කර ලන්නට උපකාරී වෙයි. කවිය මීගන් සමාජ යථාර්ථ නිරූපණයට යොමු වී ඇති ආධුනික ලේඛකයන්ගේ නිර්මාණ ප්‍රයත්නයන් කිහිපයක් මෙලෙස විග්‍රහ කළ හැකිය. ඒ සමගම ප්‍රතිභාපූර්ණ ලේඛකයන්ගේ නිර්මාණ අතර අන්තර්ගතය අතින් මෙන්ම කලාත්මක ගුණය අතින්ද උසස් මට්ටමක ලා සැලකිය හැකි කාව්‍ය රචනා නිරන්තරයෙන් සහෘද සිත් තුළ රැඳී පවතිනු ඇත.



මෙහිලා දැක්විය හැකි අගනා නිදසුනක් ලෙස පී.බී. සේනානායක විසින් රචිත "දෙවියන් මැරීම" නම් කාව්‍ය නිර්මාණය ගත හැකිය. කෙටි කතාවට හා නවකතා කරණයට වැඩි රුචියක් දැක්වූ මෙම ලේඛකයා අතින් ලියවුණ විශේෂ කාව්‍ය රචනාවක් ලෙස "දෙවියන් මැරීම" හැඳින්විය හැක්කේද සමාජ යථාර්ථය කලාත්මක ලෙසින් කවියට නැගීම හේතු කොටගෙනය.

"බුද්ධිය මිත්‍රයෙකැයි සිතූ මම
දිනක් මග රැක සිට,
මගේ දෙවියන් මරා හෙළිමි.

දැවැන්තයකු වන බුද්ධිය
අදුරෙහි මහ අඩි තබමින්

මා පිටුපසින් එනු
මට ඇසෙයි............"

(දෙවියන් මැරීම)

මේ, උක්ත කාව්‍ය නිර්මාණයේ මුල් කොටසයි.

වත්මන් සමාජයේ ජීවත් වන පුද්ගලයා විද්‍යාත්මක හා වෙනත් අංශවලින් ලබන දැනුම මෙහි දැක්වෙන බුද්ධියයි. හැඟීම නැමැති දෙවියන් මරා දමා බුද්ධිය නම් මිතුරා ළං කර ගැනීමෙන් පසුව එහි පල විපාක හඳුනා ගනිමින් යළිත් එම දෙවියන් ළං කරගන්නට උත්සහ ගත්තද, එය කළ නොහැකිය. "උන් වහන්සේ, නැඟී නොසිටින්නේ, බුද්ධිය, තම දත් දෙපෙල පෙන්නා, ......." සිටින හෙයිනි. කෙසේ නමුදු වත්මන් සමාජය තුළ ජීවත් වන්නන්, බුද්ධිය හැඟීම අතරට මැදි වී අසරණ වන ආකාරය මෙලෙසින්, පී.බී. සේනානායක අතින් පද්‍යයට නැගී ඇත්තේ සමාජය අද තරම්ම සංකීර්ණ වන්නටත් පෙරය. සේනානායක මෙම නිර්මාණයෙන් සමාජ යථාර්ථය හෙළි කරන අතරම පාඨක අප වෙතට ගෙන එන පණිවුඩය ද වැදගත්ය.

පොදුවේ ගෙන බලන විට සාහිත්‍යය මගින් සමාජ යථාර්ථය විනිවිද දැකගත හැකි වීම සාධාරණය. එසේ වුවද ඒස මගම කතුවරුන් සහෘදයා වෙත අර්ථවත් පණිවුඩයක් ගෙන එනන්ට සමත් වුවහොත් එම නිර්මාණ කාව්‍යමය අගයෙන් ද ඉහළ තලයක ලා සැලකිය හැකි වනු නොඅනුමානය. සිංහල සාහිත්‍ය කරුවන් අතරට වර්තමානයේ එක් වෙමින් සිටින අංකුර කවිකිවිඳියන් අතින් ද එවන් නිර්මාණ බිහි වීමට අවකාශ මඳ නොවන්නේය යනු අපගේ විශ්වාසයයි, ප්‍රාර්ථනයයි!

29 වන පිටෙන්

එතෙක් ශ්‍රේෂ්ඨාධිකරණය අභීතව සිය වගකීම් ඉටු කරමින් අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටියේය. මේ භාවිතය ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඉහළ වටිනාකමක් තහවුරු කරන්නක් විය.

මීට ඉහත ආණ්ඩුව බලය අනිසි ලෙස යොදා අගවිනිසුරුවරයා ධුරයෙන් ඉවත් කළ අවස්ථාවේදීද අධිකරණය මේ ආකාරයෙන්ම නිර්භීතව කටයුතු කළේය. අතලොස්සක් හැරුණුවිට රටේ සමස්ථ නීතිඥ ප්‍රජාවම එහිදී ආණ්ඩුවට එරෙහිව පාරට බැස්සේය. ආණ්ඩුව බලය යොදා මේ විරෝධතා වසර දෙකකට ආසන්න කාලයක් මැඩපවත්වාගෙන සිටියද අවසානයේ නැවතත් ධුරයෙන් පහ කළ අගවිනිසුරුවරයා නැවත ධුරයේ පිහිටුවීමට ආණ්ඩුවට සිදුවිය. මේ අවස්ථා දෙකේදීම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ අධිකරණයේ කාර්යභාරය මනාව ඉටුකිරීමට පාකිස්ථානයේ අධිකරණය සමත්වුවද අවසාන පියවරේදී එය පරාජයට පත්කිරීමට දූෂිත දේශපාලනය සමත්විය.

මේ ආකාරයෙන්ම ආණ්ඩුව සහ අධිකරණය අතර ඇතිවූ අර්බුධයකින් අධිකරණය පරාජයට පත්කර ආණ්ඩුව ජය ලැබීමේ සිද්ධියක් වාර්තා වූයේ ශ්‍රීලංකාවෙනි. ඒ ආණ්ඩුවේ දේශපාලන අවශ්‍යතා ඉටුනොකළ අගවිනිසුරුවරිය දෝෂාභියෝගයක් මගින් ධුරයෙන් ඉවත් කිරීම මුල්කරගනිමින් ඇතිවූ අර්බුධයේදීය. එහෙත් පාකිස්ථානයේ මෙන් අභීත සටනක් ගෙනයන්නට ලංකාවේ නීතිඥ සහ අධිකරණ ප්‍රජාව සමත්වූයේ නැත. එහිදී ආණ්ඩුව පහසු ජයක් හිමිකරගත්තේය. භාවිතය වෙනස් වුවද පාකිස්ථානයේ අධිකරණය ගෙන ගිය සටනද අවසන් වූයේ ආණ්ඩුවට ජය අත්කර දෙමිනි. ආසන්න කාලයක් තුළදී මේ සිදුවීම් දෙකම ලෝකයේ අවධානයට ලක්වූයේ ආසියාවේ රටවල් දෙකකිනි. ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදය මෙලෙස බිඳවැටෙමින් පවතින්නේ අරාබියේ රටවල් ගණනාවක දීර්ඝ කාලයක් තිස්සේ පැවැති ඒකාධිපති පාලනයන් බිඳවැටෙමින් ඒ රටවල් ප්‍රජාතන්ත්‍රවාදය දෙසට ගමන් කරමින් තිබියදීවීමද විශේෂත්වයකි.


# A home loan specialist who speaks your language.



**Vajira Karunaratna**
Personal Lender

Home loans can seem confusing enough, without being in your second language. At the Commonwealth Bank we have lenders like Vajira, who speak Sinhalese as well as English. Vajira not only knows your language, he knows your area too. Extensive local lending experience means he's got a pretty good idea about what kind of home loan might suit you best. And you'll usually have a decision in 24 hours.

So call **Vajira** on **0401 593 567** to set up an appointment with someone you can truly talk to.

**commbank.com.au**

**Determined** to be different

**Important information:** Applications for finance are subject to the Bank's normal credit approval. Full terms and conditions will be included in the Bank's loan offer. Fees and charges are payable. Commonwealth Bank of Australia ABN 48 123 123 124. CBALA0605